**ඉඩම් මැනුම් සභාව - 2015**

**----------------------------------**

ඉඩම් මැනුම් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සේවක පාරිතෝෂික සම්බන්ධයෙන් සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර සේවක පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකුවට සෘජු බැර එකතුව රු. 53,650 ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.3 අවිනිශ්චිත ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් වල ඇතුළත් රු. 8,820 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය වසර 02 ක් ගත වී ඇතත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනත | |
| (i) 12(1) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයෙකු විසින් සකස් කර සහතික කරන ලද නිශ්චිත වර්ගවල මුල් පිඹුරු හෝ සිතියම් පිටපත් දත්ත පාදකයක් පිහිටුවීම සඳහා තැන්පත් කළ යුතු වුවත් ඒ අනුව ක්‍රියා කර නොතිබුණි. |
| (ii) 43(1) හා (2) වගන්තිය | සභාව විසින් සියළුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරු 1,047ක් සිටියද, 2015 මාර්තු 27 දින අංක 1908 දරන ගැසට් පත්‍රයේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරු 992 කගේ නම් පමණක් පල කර තිබුණි. |

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2. ඡේදය

ප්‍රසම්පාදන විධිවිධානවලට පටහැනිව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ වැඩමුළු 02 ක් සඳහා ශාලා ගාස්තු හා දිවා ආහාරය වෙනුවෙන් පිළිවෙලින් රු. 209,540 ක් හා රු. 574,350 ක් වැයකර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.732,669 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.467,508 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,200,177 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ වැඩමුළු ආදායම රු.1,105,500 කින් වැඩි වුවද අනෙකුත් ආදායම් රු.1,353,306 කින් අඩුවීම හා සේවක ප්‍රතිලාභ රු.609,714 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව මූල්‍ය අතිරික්තයක් පෙන්නුම්කළ ද 2015 වර්ෂයේදී එය රු.732,669 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු. 2,471,638 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2015 වර්ෂයේදී රු. 2,546,395 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2015 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් 0.83 හා 2.6 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය පහළ මට්ටමක පැවතුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී මුදල් හා මුදල් සමාන දෑ වල රු. 5,195,006 කින් පහළ යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ජංගම වත්කම් තුළ 2015 වර්ෂයේදී සියයට 93 ක් හා 2014 වර්ෂයේදී සියයට 95 ක් නියෝජනය වනුයේ මුදල් හා මුදල් සමාන දෑ වන අතර ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

මැනුම් වෘත්තීය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන්වලට එකඟවන ලෙස පුහුණුවක් හෝ අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බවටත් තහවුරු කිරීම 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනත ප්‍රකාරව සභාවේ අරමුණු වේ.

ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 105 ක් වුවද වර්ෂය තුළ විසඳා තිබුණේ පැමිණිලි 64 ක් හෙවත් සියයට 61 ක ප්‍රමාණයක් පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සභාව විසින් වෘත්තීය සංවර්ධන වැඩසටහන් 6 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද පවත්වා තිබුණේ වැඩසටහන් 3 ක් පමණි.

(ඇ) ස්වකීය නිලධාරීන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභසාධන හා ක්‍රීඩා පහසුකම් සැපයිය යුතු වුවත් ඒ අනුව ක්‍රියා කර නොතිබුණි.

(ඈ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් අවශ්‍ය රීති සකස් කළ යුතු වුවත් එම නියමය පරිදි ක්‍රියාකර නොතිබුණි.

(ඉ) වාර්ෂික බලපත්‍ර නිකුත් කරනු ලැබීමට හිමිකම් ඇති සෑම මිනින්දෝරුවරයෙකුම ඉඩම් මැනුම් පනත යටතේ ලියාපදිංචි වියයුතු බව දක්වා ඇතත්, වාර්ෂිකව බලපත්‍ර ලබා නොගෙන වෘත්තීය මිනින්දෝරු කටයුතුවල යෙදෙන පුද්ගලයන් හඳුනාගැනීමට හෝ එවන් කටයුතු තහනම් කිරීමට සභාව විසින් නීති රීති හඳුන්වා දී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සභාවේ කටයුතු ආරම්භ කළ 2005 වර්ෂයෙන් පසුව මිනින්දෝරුවරයෙකු සභාවේ ලියාපදිංචි වීමේදී අයකරනු ලබන රු. 3,500 ක් වූ ලියාපදිංචි ගාස්තුව හා 2010 වර්ෂයෙන් පසුව වාර්ෂික බලපත්‍ර වෙනුවෙන් මිනින්දෝරුවරයෙකුගෙන් අයකරනු ලබන රු. 2,500 ක් වූ ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංශෝධනය කර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

ඉඩම් මැනුම් පනතේ 38 (ඇ) ඡේදය පරිදි සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් හා සේවකයින් පත්කළ යුතු බව සඳහන් කර තිබුණද, 2016 අප්‍රේල් 30 දින වන විටත් සභාවට බඳවා ගෙන තිබුණේ ලිපිකරුවන් දෙදෙනෙකු සහ කාර්යාල කාර්ය සහායකවරයෙකු පමණි. ඒ අනුව නිලධාරීන්ගේ හිඟය පැමිණිලි විසඳීමේ හා ලිපිගොනු යාවත්කාලීන කිරීමේ කටයුතුවලට බාධාවක් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව මාස 03 කට වරක් විගණන කමිටු රැස්වීම පැවත්විය යුතු බව දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ මුල් අර්ධ වර්ෂයේ දී කිසිදු රැස්වීමක් නොපවත්වා දෙවන අර්ධ වර්ෂයේදී රැස්වීම් හතරම පවත්වා තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් වියදම් තත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේදී ආදායම් ශීර්ෂ 04 ක වැය විෂයයන් 06 ක සියයට 11 සිට සියයට 19 අතර විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර එම තනතුරට නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කරන ලෙසට 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක

සභාව විසින් නියෝග කර තිබුණද එම තනතුර පිරවීමට විගණිත දිනය වූ 2016 මාර්තු 31 දක්වාම කටයුතු කර නොතිබුණි.

## 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2014 වර්ෂයේ සභාවේ වාර්ෂික වාර්තාව 2016 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.5 සමාජ වගකීම් ඉටුකිරීම

බලයලත් මිනින්දෝරුවන් විසින් මැනුම්කර සකස් කරන පිඹුරු මහජනතාවට ලබාගැනීමට හැකිවන පරිදි ඒවායේ පිටපත් මැනුම් සභාවට එවිය යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | නිසි පරිදි ලෙජර් ගිණුම් පවත්වාගෙන නොයෑම හේතුවෙන් ගිණුම්වල අවිනිශ්චිත ශේෂයක් පැවතීම. |
| (ආ) ආදායම් පාලනය | ගාස්තු සංශෝධනය කර නොතිබීම. |